NEW

# 2565 - මූලික පිරිවෙන් මධ්‍ය වාර පරීක්ෂණය - 2022

(නව නිර්දේශය)

| 08 | S | I, II |
|---|---|---|

පැ තුනයි

## සමාජ විද්‍යාව - 03 ශ්‍රේණිය

## Sociology Grade 03

අමතර කියවීම් කාලය මිනිත්තු 10 යි

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත්
පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

## සමාජ විද්‍යාව 1 පත්‍රය

**සැලකිය යුතුයි :**

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40ක් හිමි වේ.
- අංක 01-40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරු වලින් වඩාත් නිවැරැදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

(1) 'සමාජ විද්‍යාව සමාජීය විද්‍යාවන් අතර රැජිනයි' මෙම අදහස සමාජගත කළ සම්භාව්‍ය සමාජ විද්‍යාඥයා කවුද?

(1) ටැල්කොට් පර්සන්ස්. (2) ඔගස්ට් කොම්ට්.
(3) එමිල් ඩූර්කයිම්. (4) හර්බට් ස්පෙන්සර්.

(2) 'සමාජය සත්ත්ව ශරීරයකට සමානය' යන අදහස ඉදිරිපත් කරමින් සමාජය පිළිබඳ අදහස ඉදිරිපත් කළේ,

(1) කාල් මාක්ස් ය. (2) මැක්ස් වෙබර් ය.
(3) හර්බට් ස්පෙන්සර් ය. (4) එමිල් ඩූර්කයිම් ය.

(3) මධ්‍ය කාලීන වැඩවසම් සමාජය තුළ රදළයා හා ප්‍රවේනිදාසයා අතර ගැටුම් පැවති බව,

(1) රැල්ෆ් ලින්ටන්ගේ අදහසයි. (2) ඊ.බී ටයිලර්ගේ අදහසයි.
(3) ජෝන් කැල්වින්ගේ අදහසයි. (4) කාල් මාක්ස්ගේ අදහසයි.

(4) මානව සමාජය පිළිබඳව අධ්‍යනය කළ හැකි විෂය කාණ්ඩය නිවැරදිව ඇතුළත් වරණය තෝරන්න.

(1) ඉතිහාසය හා සමාජ විද්‍යාවයි. (2) ජීව විද්‍යාව හා සමාජ විද්‍යාවයි.
(3) සමාජ විද්‍යාව හා භෞතික විද්‍යාවයි. (4) ජීව විද්‍යාව හා භෞතික විද්‍යාවයි .

(5) නාගරික සමාජය තුළ භූගෝලීය සීමාවන් පුළුල්වීම කෙරෙහි ප්‍රබල ලෙස බලපෑම් කළ සාධකය කුමක්ද?

(1) විදේශිකයින් සංක්‍රමණය වීමයි. (2) ග්‍රාමීය ජනතාව සංක්‍රමණය වීමයි.
(3) සමාජ ප්‍රශ්න වර්ධනය වීමයි. (4) පාරිසරික දූෂණය ඉහල යාමයි

(6) ගිහි සමාජය හා පැවිදි සමාජය තුළ පවතින අන්තර් සබඳතා මැනවින් අර්ථ විවරණය කරන බෞද්ධ සූත්‍ර දේශනාව වන්නේ,

(1) කාලාම සූත්‍රයයි. (2) චක්කවත්තිසීහනාද සූත්‍රයයි.

(3) සිඟාලෝවාද සූත්‍රයයි. (4) සාමඤ්ඤඵල සූත්‍රයයි

(7) සමාජ පරිණාමය අධ්‍යනය කිරීමට උචිත දෘෂ්ටි කෝණයක් නොවන්නේ.

(1) කෘත්‍යවාදී දෘෂ්ටි කෝණයයි. (2) සම්මතවාදී දෘෂ්ටි කෝණයයි.

(3) පරිණාමවාදී දෘෂ්ටි කෝණයයි. (4) සමාජවාදී දෘෂ්ටි කෝණයයි.

(8) සමාජ විද්‍යාවේ අධ්‍යනය කරන 'ගතිකත්වය' යන්නෙහි නිවැරදි අර්ථ පූරණය නොවන වරණය තෝරන්න.

(1) තත්ත්වය. (2) පරිවර්තනය.

(3) විපර්යාසය. (4) පරිණාමයී

(9) සමාජ හා සමාජ මානව විද්‍යාව තුළ අධ්‍යනයට බඳුන්වන ප්‍රබල සංකල්පයක් නම්,

(1) පවුල් සංස්ථාවයි. (2) සමාජ පරිණාමයයි.

(3) සමාජ සමූහයි. (4) සමාජානුයෝජනයයි.

(10) ළදරු විය, ළමාවිය, යොවුන් විය, මැදිවිය, මහලු විය යන අවස්ථා පසුකරමින් විවිධාකාර වෙනස්කම් මාලාවකට බඳුන්වේ. බුදු දහම තුළ මෙම සංකල්ප හඳුන්වනුයේ,

(1) මිනිසා වයස්ගත භාවයට පත්වන බවයි.

(2) මිනිසා මහලුවියට ගමන් කිරීමේදී විවිධ අවස්ථා පසුකරන බවයි.

(3) මිනිසා විපරිණාමයට පත්වීමෙන් දුක ඇතිවන බවයි.

(4) මිනිසා වෙනස්වන සත්ත්වයෙක් බවයි.

(11) ලාංකික ජන සමාජය තුළ බුදු දහම රෝපණය වීම කෙරෙහි ප්‍රබල ලෙස බලපෑම් කළ සාධකය නම්,

(1) දුමින්දාගමනයයි. (2) ශාක්‍ය සිංහාගමනයයි.

(3) සෙන්ට් සිමෝන්. (4) ජෝන් ස්ටුවට් මිල්.

(12) සමාජ විද්‍යාවේ අධ්‍යනයට බඳුන්වන 'ආරෝපිත තත්ත්වය' යන සංකල්පයට ඉතා ඉහල වලංගුතාවයක් හිමිවූයේ,

(1) සාම්ප්‍රදායික සමාජවලය. (2) නූතන සමාජවලය.

(3) සංකීර්ණ සමාජවලය. (4) නාගරික සමාජවලය.

(13) ඔගස්ට් කොම්ට්, එමිල් ඩූර්කයිම්, මැක්ස් වෙබර්, කාල් මාක්ස් යන සම්භාව්‍ය සමාජ විද්‍යාඥයින් සමාජය පිළිබඳව ඉදිරිපත් කළ මතවාද අතර දක්නට ලැබෙන පොදු ලක්ෂණය කුමක්ද?

(1) සමාජය අධ්‍යයනය කිරීම සමාජ විද්‍යාඥයාගේ අරමුණ බවයි.

(2) සරල නොදියුණු මූලික සමාජයක් පැවති බවයි.

(3) පුද්ගල චර්යා හැඩගැසීමට සමාජය බලපාන බවයි.

(4) සමාජ විද්‍යාව ලොව ජනප්‍රියතම සමාජීය විද්‍යා විෂය බවයි.

(14) පැරණි සමාජ වල යාන්ත්‍රික ස්වරූපයක ලක්ෂණ ක්‍රියාත්මක වූ බව,

(1) රැල්ෆ් ලින්ටන්ගේ අදහසයි. (2) ඩී.පී මර්ඩොක්ගේ අදහසයි.

(3) එමිල් ඩූර්කයිම්ගේ අදහසයි. (4) ඔගස්ට් කොම්ට්ගේ අදහසයි.

(15) යුරෝපා සමාජය තුළ ආගමික, කාර්මික, දේශපාලන පිබිදීමක් ඇති වූයේ කුමන සියවස්වලද?

(1) 13 හා 14 යන සියවස්වලය. (2) 14 හා 15 යන සියවස්වලය.

(3) 15 හා 16 යන සියවස්වලය. (4) 16 හා 17 යන සියවස්වලය.

(16) බෞද්ධ දර්ශනය අධ්‍යයනය තුළ අපට හමුවන ප්‍රබල ඉගැන්වීම් සංකල්පයක් නම් ,

(1) අන්තර් සමාජ ඒකාග්‍රතාවයයි. (2) සමාජ විසංවිධානකාරී බවයි.

(3) සමාජ පරිහානියයි. (4) සමාජ පරිණාමයයි.

(17) මානව සමාජයේ ආරම්භය, විකාශනය, පරිහානිය යනාදී සංසිද්ධීන් පිළිබඳව කරුණු දැක්වෙන බෞද්ධ සූත්‍ර දේශනාව කුමක්ද?

(1) දීඝ නිකායේ සාමඤ්ඤඵල සූත්‍රය. (2) දීඝ නිකායේ අග්ගඤ්ඤ සූත්‍රය.

(3) දීඝ නිකායේ චක්කවත්තිසීහනාද සූත්‍රය. (4) දීඝ නිකායේ සිඟාලෝවාද සූත්‍රය.

(18) දන්සල් දීම, බෝධි පූජා, තොරණ, පෙරහැර, වෙසක්, පොසොන් සැරසිළි යනාදි අංගයන්,

(1) බුදු දහමේ ඉගැන්වීමිය.

(2) ලෞකික ජීවිතය සැපවත් වන ඉගැන්වීමිය.

(3) ජනප්‍රිය බුදු දහමේ එන ඉගැන්වීමිය.

(4) විමුක්තිය ලබාගැනීමට උපකාරවන ඉගැන්වීමිය.

(19) මානවයා විසින් නිර්මාණය කරගන්නා ලද සංස්කෘතිය ඉගෙනුම් ක්‍රියාවලියක් ලෙස පරම්පරාවෙන් පරම්පරාවට රැගෙන යයි. මෙම ක්‍රියාවලිය,

(1) පරිණාමයයි. (2) අධ්‍යාපනයයි.

(3) සන්නිවේදනයයි. (4) සමාජානුයෝජනයයි.

(20) ලාංකේය සමාජ ව්‍යුහය තුළ හඳුනාගත හැකි උප සංස්කෘතියක් නම් ,

(1) ආදිවාසී සංස්කෘතියයි. (2) හිංදු සංස්කෘතියයි.

(3) ඉස්ලාම් සංස්කෘතියයි. (3) කිතුණු සංස්කෘතියයි.

(21) සමාජ විද්‍යාවට අනුව 'මානව සමාජයක්' සඳහා වඩාත් උචිත පිළිතුර දැක්වෙන වරණය තෝරන්න.

(1) බස් රථයක. (2) දුම්රියක.

(3) පාසලක. (4) ගුවන් යානයක.

(22) බ්‍රිතාන්‍ය මානව විද්‍යාවේ පුරෝගාමියා වශයෙන් ඇගයීමට බඳුන් වන්නේ,

(1) ඊ.බී ටයිලර් ය. (2) ඔගස්ට් කොම්ට් ය.

(3) සිසාරෝ ලොම්බ්‍රෝසෝ ය. (4) රේමන්ඩ් විලියම්ස් ය.

(23) පුද්ගලයාගේ මෙලොව පරලොව දියුණුව මෙන්ම සමාජ සම්බන්ධතා ගොඩනගා ගැනීමේදී යහපත් සමාජානුයෝජනයේ අවශ්‍යතාවය මැනවින් විග්‍රහ කරන බෞද්ධ සූත්‍ර දේශනා මොනවාද?

(1) කාලාම සූත්‍රය හා පරාභව සූත්‍රය. (2) සාමඤ්ඤඵල සූත්‍රය හා අග්ගඤ්ඤ සූත්‍රය.

(3) මධුර සූත්‍රය හා අම්බට්ට සූත්‍රය. (4) සිගාලෝවාද සූත්‍රය හා ව්‍යග්ගපජ්ජ සූත්‍රය.

(24) බෞද්ධ බැතිමතුන්ගේ නොමද ගෞරවයට බඳුන්වන 'වෙසක් උත්සවය' ජාත්‍යන්තර වශයෙන් නිවාඩු දිනයක් කිරීම උදෙසා පුරෝගාමීව ක්‍රියා කළේ,

(1) මර්සලින් ජයකොඩි පියතුමාය. (2) අර්නස්ට් පෝරුතොට පියතුමාය.

(3) ලක්ෂ්මන් කදිරගාමර් මහතාය. (4) ආනන්ද කුමාරස්වාමි මහතාය.

- ප්‍රශ්න අංක 25-27 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සැපයීම සඳහා (අ) තීරුවේ දැක්වෙන සංස්කෘතීන් හා ඒවායේ ඉගැන්වීම් ඇතුළත් කෘතීන් (ආ) තීරුවේ දැක්වේ. සංස්කෘතිය පිළිබඳ ඉගැන්වීම් ඇතුළත් කෘතීන් නිවැරදිව තෝරන්න.

| | (අ) | (ආ) |
|---|---|---|
| (25) | හිංදු සංස්කෘතිය | (01) බයිබලය |
| (26) | ඉස්ලාම් සංස්කෘතිය | (02) භගවත් ගීතාව |
| (27) | කතෝලික සංස්කෘතිය | (03) අල් කුරාණය |

(28) පුද්ගලයෙකු සමාජයට අනුගතකිරීමේදී පළමුව විශේෂ කාර්යභාරයක් ඉටුකරන ආයතනය නම්,

(1) මානව පවුල් සංස්ථාවයි. (2) අධ්‍යාපන සංස්ථාවයි.

(3) ආගමික සංස්ථාවයි. (4) විවාහ සංස්ථාවයි.

(29) බෞද්ධ භික්ෂූන් වහන්සේ ගිහි සමාජය උදෙසා ක්‍රියා කළ යුතු ප්‍රමුඛතම කාර්යභාරය ඇතුළත් වරණය තෝරන්න.

(1) දුගී දුප්පත් අයට පිහිට වීමයි. (2) අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කිරීමයි.

(3) සමාජ ප්‍රශ්න වලට විසඳුම් ඉදිරිපත් කිරීමයි. (4) විමුක්තිය අවබෝධ කර දීමයි.

(30) බුදුන්වහන්සේ විසින් දේශිත සතර සංග්‍රහ සම්පත් අන්තර්ගත බෞද්ධ සූත්‍ර දේශනාව කුමක්ද?

(1) කාලාම සූත්‍රයයි. (2) චංකී සූත්‍රයයි.

(3) සිගාලෝවාද සූත්‍රයයි. (4) මහා පරිනිබ්බාණ සූත්‍රයයි.

(31) ආසියාතික සමාජය තුළ වයෝවෘද්ධ වැඩිහිටියන්ට ඉහළ ආරක්ෂාවක් ලැබෙන අතර ඇතැම් සමාජයන්හි ඔවුන් මරා දැමීම දරුවන්ගේ යුතුකමක් බව,

(1) ඩෝබු සමාජයේ පිළිගැනීමයි. (2) සුනී සමාජයේ පිළිගැනීමයි.

(3) ඇරපේස් සමාජයේ පිළිගැනීමයි. (4) ඇස්කිමෝ සමාජයේ පිළිගැනීමයි.

- පහත සඳහන් කරුණු අධ්‍යනය කර ප්‍රශ්න අංක 32-34 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සැපයීම සඳහා උපයෝගි කරගන්න.

**(A) නොපැනවූ නීති නොපැනවීම.** **(B) පරිත්‍යාගය**

**(C) සුදුසු ප්‍රදේශයක වාසය කිරීම.** **(D) වැඩිහිටියන්ට සැළකීම.**

**(E) අවිහිංසාව.** **(F) දෙමාපියන්ට සැළකීම.**

(32) සමාජ පාලනයේදී පාලකයා විසින් අනුගමනය කළ යුතු පිරිහීමට බඳුන් නොවන අපරිහානී ධර්ම ඇතුළත් වරණය තෝරන්න.

(1) A හා B ය. (2) C හා D ය.

(3) E හා F ය. (4) A හා D ය.

(33) බුදුන් වහන්සේ විසින් දේශිත දස රජ දහම් නිවැරදිව දැක්වෙන පිළිතුර වන්නේ,

(1) A හා B ය. (2) C හා D ය.

(3) B හා E ය. (4) E හා F ය.

(34) මහා මංගල සූත්‍ර දේශනාව තුළ අන්තර්ගත විග්‍රහයන් ඇතුළත් වරණය තෝරන්න.

(1) A හා B ය. (2) B හා C ය.

(3) D හා E ය. (3) C හා F ය.

(35) සමාජ විසංවිධානයෙන් තොරව යහපත් සමාජ පාලනයක් ගෙනයෑම උදෙසා පිටිවහල් වන විධිමත් නොවන සමාජ පාලන ආයතනය ඇතුළත් වරණය තෝරන්න.

(1) පොලිසිය. (2) සාරධර්ම.

(3) අධිකරණය. (4) බන්ධනාගාරය.

(36) පුද්ගලයා තුළ අපගාමී චර්යාවන් වර්ධනය වීම කෙරෙහි බලපෑම් නොකරන සාධකය ඇතුළත් නිවැරදි පිළිතුර තෝරන්න.

(1) මානසික අසහනය. (2) ඉච්ඡාභංගත්වය.

(3) අල්පේච්ඡතාවය. (4) ආර්ථික දරිද්‍රතාවය.

(37) බුදුන් වහන්සේගේ දර්ශනය තුළ ඕනෑම පුද්ගලයෙකුට සිතීමේ හා විමසීමේ අයිතිය ලබා දී ඇති බව ප්‍රකාශිත සූත්‍ර දේශනාව කුමක්ද?

(1) චුල්ලහත්ථිපදෝපම සූත්‍රය. (2) සිඟාලෝවාද සූත්‍රය.

(3) චක්කවත්තිසීහනාද සූත්‍රය. (4) කාලාම සූත්‍රය.

(38) භික්ෂු සමාජයේ සුරක්ෂිතභාවය වර්ධනය කිරීම උදෙසා වඩාත් උචිත සමාජ ධර්මතාවන් අන්තර්ගත වරණය තෝරන්න.

(1) සේඛියා. (2) පංචශීලය.

(3) දස ශීලය. (4) සීලය.

(39) බුදු දහමේ ඉගැන්වෙන ශ්‍රද්ධාව ප්‍රධාන අංශ ගණන කීයද?

(1) දෙකකි. (2) තුනකි.

(3) හතරකි. (4) පහකි.

(40) ආර්ය අෂ්ටාංගික මාර්ගයේ එන ‘සම්මා ආජීවය’ නම් සංකල්පයේ සමාජ විද්‍යාත්මක වැදගත්කම නම්,

(1) අන්තර් සබඳතා පැවැත්විය යුතු බවයි.

(2) යහපත් දිවිපැවැත්මකට හේතු වන බවයි.

(3) සමාජ ප්‍රශ්න වලට විසඳුම් තිබෙන බවයි.

(4) ආගමික සහජීවනයට හේතු වන බවයි.

* * *

# 2565 - මූලික පිරිවෙන් මධ්‍ය වාර පරීක්ෂණය - 2022

| 08 | S | I, II |
|---|---|---|

## (8) සමාජ විද්‍යාව - I, II

## සමාජ විද්‍යාව - II පත්‍රය

- පළමුවන ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න හතරක්ද තෝරාගෙන, ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

---

(01)

(i) සමාජ විද්‍යාව (Sociology) යන පදය ආශ්‍රය ගෙන ඇති භාෂාවන් දෙක නම් කරන්න.

(ii) දහසය වන සියවසේ කිතුණු ආගම නව පරිවර්තනයකට බඳුන් කළ පූජකවරු දෙදෙනා නම් කරන්න.

(iii) දෙවනපෑතිස් රජු විසින් බුදු දහමේ ව්‍යාප්තිය උදෙසා ආරම්භ කරන ලද පිරිවෙන් 02ක් ලියන්න.

(iv) කෝට්ටේ යුගයේ රචිත සන්දේශ සාහිත්‍යාංග දෙකක් නම් කරන්න.

(v) පිරිවෙන් අධ්‍යාපනය තුළින් අපේක්ෂා කරන මූලික අරමුණු දෙකක් සඳහන් කරන්න.

(vi) සමාජයක් නිර්මාණය වීම සඳහා අවශ්‍ය කරන මූලික සාධක දෙකක් නම් කරන්න.

(vii) ශ්‍රී ලාංකිය සමාජයට හිමි ස්වභාවික වරායන් දෙකක් නම් කරන්න.

(viii) ශ්‍රී ලාංකිය සමාජයේ ආදිවාසීන් විසින් අනුගමනය කරන ආගමික විශ්වාස දෙකක් නම් කරන්න.

(ix) සිගාලෝවාද සූත්‍රයට අනුව නැගෙනහිර, දකුණ යන දිශාවන්ට සමානකර/උපමාකර දැක්වූයේ කවුද?

(x) සමාජ විසංවිධානය අවමකර ගැනීම සඳහා යොදාගත හැකි ප්‍රධාන සමාජ පාලන ක්‍රම දෙක නම් කරන්න.

(ලකුණු 02×10=20 යි)

(02)

(i) එමිල් ඩූර්කයිම් විසින් රචිත කෘතීන් දෙකක් ලියන්න. (ලකුණු 02 යි)

(ii) ඔබ දන්නා සමාජ ප්‍රශ්න තුනක් නම් කරන්න. (ලකුණු 03 යි)

(iii) සමාජ ප්‍රශ්න අවමකර ගැනීම සඳහා පංචශීලය යොදාගත හැකි බව කරුණු දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 05 යි)

(03)

(i) පුද්ගලයෙකුට හිමිවන ආරෝපිත තත්ත්වයන් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ii) සමාජ විද්‍යාව මගින් අධ්‍යනය කරන ක්ෂේත්‍ර තුනක් සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) සමාජ විද්‍යාව විෂය ඉගෙනීමෙන් ඇති ප්‍රයෝජන ක්ෂේත්‍ර දෙකක් ඇසුරින් පැහැදිළි කරන්න.

(ලකුණු 05 යි)

(04)

(i) සමාජයක් වර්ග කළ හැකි ප්‍රධාන ආකාරයන් දෙක ලියන්න. (ලකුණු 02 යි)

(ii) උප්පාද,ඨිති,භංග යන සංකල්පවල සරල අදහස ලියන්න. (ලකුණු 03 යි)

(iii)මහින්දාගමනය හේතුවෙන් ලංකා සමාජය තුළ ඇති වූ වෙනස්කම් ක්ෂේත්‍ර දෙකක් ඔස්සේ කරුණු දක්වන්න. (ලකුණු 05 යි)

(05)

(i) දළඳා වහන්සේ මෙරටට වැඩම කිරීම උදෙසා පුරෝගාමී වූ රාජකීය දෙපළ නම් කරන්න.

(ලකුණු 02 යි)

(ii) දැහැමිව ධනය ඉපයීමේදී ගොවින් විසින් සිය ගොවිතැනට සතුන්ගෙන් වන හානිය අවම කර ගැනිම සඳහා භාවිත කළ කෙම් ක්‍රම තුනක් ලියන්න. (ලකුණු 03 යි)

(iii)සමාජ සංවරතාව ගොඩනගා ගැනීම උදෙසා හින්දු ආගමේ එන සදාචාරාත්මක ඉගැන්වීම් සංකල්ප දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05 යි)

(06)

(i) ශ්‍රී ලාංකීය සමාජය තුළ දක්නට ලැබෙන සමාජ බෙදීම් දෙකක් ලියන්න. (ලකුණු 02 යි)

(ii) පැරණි සමාජය තුළ දක්නට ලැබෙන ලක්ෂණ තුනක් සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii)දෙමාපියන් හා දරුවන් අතර මනා අන්තර් ක්‍රියාකාරීත්වයක් ගොඩනගා ගැනීමට හේතුවන සාධක දෙකක් සිඟාලෝවාද සූත්‍රය ඇසුරෙන් විග්‍රහ කරන්න. (ලකුණු 05 යි)

(07)

(i) පුද්ගලයෙකුගේ පරිහානියට හේතුවන කරුණු දෙකක් පරාභව සූත්‍රය ඇසුරින් ලියන්න.(ලකුණු 02 යි)

(ii) ශිෂ්‍යයෙකු විසින් තම ගුරුවරුන් උදෙසා කළයුතු සද්කාර්යයන් තුනක් ලියන්න. (ලකුණු 03 යි)

(iii)අන්තර් සමාජ සම්බන්ධතා ධනාත්මකව ගොඩනගා ගැනීමට සතර සංග්‍රහ වස්තුවේ එන සංකල්ප උපයෝගි කරගත හැකි ආකාරය කරුණු දෙකක් ඇසුරින් පැහැදිළි කරන්න. (ලකුණු 05 යි)

(08)

(i) සමාජ පාලනයේ ප්‍රධාන අංශයන් දෙක නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) නූතනයේ විධිමත්ව සමාජය පාලනය කිරීම උදෙසා යොදාගන්නා ආයතන දෙකක් නම් කරන්න. (ලකුණු 03 යි)

(iii)සමාජ පාලනය උදෙසා භික්ෂුව විසින් ලබාදිය හැකි දායකත්වය ප්‍රධාන අංශ දෙකක් ඇසුරින් පැහැදිළි කරන්න. (ලකුණු 05 යි)

* * *